# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# **2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

---

[සහතිකය සටහන් කලේ **2005** නොවැම්බර් මස **30** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 දෙසැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 36.50 යි. **තැපැල් ගාස්තුව :** රු. 12.50 යි.

# 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත

[සහතිකය සටහන් කළේ 2005 නොවැම්බර් මස 30 වන දින]

එල්. ඩී.— ඕ.77/2002.

ශ්‍රී ලංකා සංචාරක කටයුතු සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද ; සංචාරක කටයුතු කර්මාන්තය හා වෙනත් ආශ්‍රිත කර්මාන්තවලට අදාළ ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යම් බලතල එකී අධිකාරිය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; කර්මාන්තය විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ජාතික රාජ්‍ය සභාවේ 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීම හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය.

## I වන කොටස

## I වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**2**. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය (1) වන උපවගන්තිය මගින් ඊට පවරා දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එය විසින් සහ එයට එරෙහිව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය භාරයේ තැබිය යුතු අතර, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) අධිකාරියේ මුද්‍රාව, අධිකාරියේ සභාපතිවරයා හා සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී, අධිකාරිය විසින් හෝ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද සියලු සාධන පත්‍රවලට තැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් ඒ ලේඛනවලට අත්සන් තැබිය යුතු ය.

අධිකාරියේ පරමාර්ථ.

**3**. අධිකාරියේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකාවේ දී සහ විදේශයන්හි දී සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් දියුණු කිරීම ;

(ආ) චාරිකා හා සංචාරක කර්මාන්තයට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් සම්පාදිත ප්‍රතිපත්ති ඇතුළත, මෙම ක්ෂේත්‍රයට අදාළව සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා හට උපදෙස් දීම ;

(ඇ) සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා අළෙවි කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි සිදු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශයට මග පෙන්වීම ;

(ඈ) මානව සම්පත් පුහුණු කිරීමේ කටයුතු සහ සංවර්ධන කටයුතු භාර ගැනීමට, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට මග පෙන්වීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීමට සහ ව්‍යාප්ත කිරීමට දායකත්වයක් ලබාදීමේ අරමුණින්, සංචාරක කර්මාන්තය සහ චාරිකා පිළිබඳ ව්‍යාපාරික ක්ෂේත්‍ර නංවාලීමට කටයුතු කිරීම ;

(ඊ) සත්කාරක සේවා පිළිබඳ කර්මාන්තය ද ඇතුලුව, ප්‍රමාණවත්, ආකර්ශණීය සහ කාර්යක්ෂම සංචාරක සේවා දැරිය හැකි ආකාරයෙන් වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(උ) සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාළව, දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති වැඩි දියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත්‍ර ලබා දීම සහ බලය ලබා දීම ;

(ඌ) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට සහ ඒ කර්මාන්තයට සම්බන්ධිත ප්‍රවර්ධනාත්මක කටයුතු සහ පුහුණු කටයුතුවලට සහභාගිවීමට පෞද්ගලික අංශයේ තැනැත්තන් සහ පුද්ගල මණ්ඩල දිරිමත් කිරීම ;

(එ) ඉහත පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

4. අධිකාරිය, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :— අධිකාරියේ සංයුතිය.

(අ) අධිකාරියේ සභාපතිවරයා ;

(ආ) 10 වන වගන්තිය යටතේ පත්කරනු ලබන (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඇ) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඈ) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඉ) ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් සංගමය විසින් නම් කරන ලද එක් සාමාජිකයකු ;

(ඊ) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමය විසින් නම් කරන ලද එක් සාමාජිකයකු ;

(උ) චාරිකා ඒජන්තවරුන්ගේ සංගමය විසින් නම් කරන ලද එක් සාමාජිකයකු ;

(ඌ) චාරිකා සහ සංචාරක ක්ෂේත්‍රයෙහි පළපුරුද්දක් සහ දැනුමක් ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු ; සහ

(එ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු.

අධිකාරියේ සාමාජිකත්වයට නුසුදුස්සකු වීම ආදිය.

**5**. (1) යම් තැනැත්තකු, ඔහු—

(අ) යම් පන්තියක හෝ විස්තරයක සංචාරක සේවා මෙහෙයවන්නා වූ හෝ සපයන්නා වූ යම් ව්‍යාපාරයක අයිතිකරු, හවුල්කරු, අධ්‍යක්ෂ, බහුතර කොටස්කරු හෝ සේවා නියුක්තකයකු වේ නම් ;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් ;

(ඇ) චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වරදකරු වේ නම් ;

(ඈ) සිහිවිකල් බවට හෝ ශාරීරික අශක්නුතාවකට පාත්‍ර වී ඇත්නම් ;

(ඉ) බංකොලොත්භාවයට හෝ වස්තු භංගත්වයට පත් වී එම තත්ත්වයෙන් නිදහස් වී නොමැති නම් ; හෝ

(ඊ) පූර්ව දැනුම් දීමකින් තොරව අධිකාරියේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිට ඇත්නම්,

ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් නොකඩවා සිටීමට නුසුදුස්සකු වන්නේ ය :

එසේ වුව ද, 4 වන වගන්තියේ (ඉ), (ඊ), (උ) හා (ඌ) ඡේද ප්‍රකාර පත්කරන ලද සාමාජිකයකු සම්බන්ධයෙන් (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) අධිකාරියේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, ඒ ධුරයට ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා ධුරය දැරිය යුතු අතර, නැවත පත්කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) අධිකාරියේ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා තත් කාර්යය සඳහා යවනු ලබන ලිපියක් මගින්, කවර විටෙක වුව ද ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) අධිකාරිය විසින් ඇතුළත් වී ඇත්තා වූ හෝ ඇතුළත් වීමට යෝජනා කරනු ලැබ ඇත්තා වූ කොන්ත්‍රාත්තුවකට යම් ලෙසකින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධ වූ අධිකාරියේ සාමාජිකයකු විසින්,

අධිකාරියේ යම් රැස්වීමක දී ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම අධිකාරියේ වාර්තාවල සටහන් කළ යුතු ය. ඒ සම්බන්ධතාවට අදාළ යම් කරුණක් පිළිබඳ අධිකාරියේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

(5) අධිකාරියේ කිසිම ක්‍රියාවක් හෝ නීති කෘත්‍යයක් එහි සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හේතුකොට ගෙන පමණක් නිර්බල වූ ලෙස නොසැලකිය යුතු ය.

(6) අධිකාරියේ අධ්‍යක්ෂවරයා නොවන යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය වන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු දක්වා එසේ කරනු ලැබිය හැකි ය.

(7) සභාපතිවරයා, කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ පත්කරන ලද සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ දින පටන්, එය බලාත්මක විය යුතු ය.

(8) සභාපතිවරයා හෝ යම් පත්කරන ලද සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත්කරනු ලැබීම සිදු වූ විටෙක, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා අනුප්‍රාප්ත වීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්තවන සාමාජියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවූ කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(9) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, ස්වකීය ධුරයේ කාර්ය කරගෙන යාමට සභාපතිවරයාට හෝ යම් පත්කරන ලද සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා හෝ ඒ සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා, අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

දිගුකාලීන ඉලක්ක හා සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම හා අනුමත කිරීම.

**6**. (1) අධිකාරිය විසින්—

(අ) ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු සංවර්ධනය සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක ;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සඳහා යෝජිත සිවු අවුරුදු සැලැස්ම,

ක්‍රමවත්ව සකස් කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) පළමු වන උපවගන්තිය යටතේ වූ දිගුකාලීන ඉලක්ක හා සිවු අවුරුදු සැලැස්ම ලැබුණු විට, අමාත්‍යවරයා විසින් එය අනුමතය සඳහා, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍ය මණ්ඩලය විසින් දිගුකාලීන ඉලක්ක හා සිවු අවුරුදු සැලැස්ම සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ඉහත කී සිවු අවුරුදු සැලැස්ම, ප්‍රතිපත්තිමය වෙනස් කිරීම් හෝ වෙනත් නව දිගුකාලීන ඉලක්ක ඇතුළත් කිරීමේ අරමුණින් වාර්ෂිකව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය. එවැනි සෑම ප්‍රතිශෝධනයක් ම අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ රැස්වීම් ආදිය.

**7**. (1) අධිකාරියේ සභාපතිවරයා විසින් අධිකාරියේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය.එවැනි යම් රැස්වීමක දී සභාපතිවරයා නොපැමිණි විටෙක පැමිණි සාමාජිකයන් විසින් තෝරාගනු ලැබූ යම් සාමාජිකයකු විසින්, ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) සභාපතිවරයාට හෝ යම් රැස්වීමක මුලසුන දරන තැනැත්තාට, ඔහුගේ ඡන්දයට අතිරේකව, තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය, අධිකාරිය විසින් අන්‍යාකාරයකින් එකඟ වන්නේ නම් මිස, සාමාජිකයන් පස් දෙනෙක් විය යුතු ය.

(4) අධිකාරියේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම සඳහා අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය.

**8**. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ පිහිටුවනු ලැබිය යුතු ය. කෙසේ වුව ද, අධිකාරිය විසින්, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

අධිකාරියේ බලතල පැවරීම.

**9**. (1) අධිකාරිය විසින්, මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් එය වෙත පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ල ම හෝ ඒ අතුරෙන් කිසිවක් සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය. එවැනි පැවරීමක් කර ඇත්තේ වුව ද, එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම, අධිකාරිය විසින් නොකඩවා කරනු ලැබිය හැකි ය.

(2) පළමු වන උපවගන්තිය ප්‍රකාර, තමා වෙත පිරිනමන ලද හෝ භාර කරන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා අධිකාරියේ සාමාන්‍ය හා විශේෂ විධානවලට සභාපතිවරයා යටත් විය යුතු ය.

10. (1) අධිකාරියේ උපදේශය මත, අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු තැනැත්තෙක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, නියම කරනු ලැබ ඇති පරිදි විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන විධායක නිලධරයා විය යුතු බව.

(2) අධිකාරිය විසින් ලියවිල්ලකින් ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් මත, අමාත්‍යවරයා විසින් අවශ්‍ය පරිදි කරන ලද පරීක්ෂණයකින් පසුව දක්වනු ලබන හේතූන් මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවිට, අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරය අත්හැර ගිය ලෙසින් සලකනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයාගේ යෝජනාවක් මත අවශ්‍ය යයි සලකනු ලබන යම් බලයක් හෝ කර්තව්‍යයක් අධිකාරිය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි අධිකාරියේ රීතිවලට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ඒ ධුරයට තමා පත් කරනු ලැබූ දින පටන් අවුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

11. (1) 26 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සංචාරක සංවර්ධන ප්‍රදේශ තුළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම වගබලාගැනීම සඳහා සභාපතිවරයා වගකිව යුතු ය. සභාපතිවරයාගේ බලතල ආදිය.

(2) සභාපතිවරයා අධිකාරියේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, ඔහු නොපැමිණි විටෙක දී, පැමිණි සාමාජිකයන් විසින් තෝරාගනු ලබන යම් සාමාජිකයකු රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

12. පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ල ම හෝ ඒ අතුරෙන් යමක් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය :— අධිකාරියේ බලතල හා කර්තව්‍ය.

(අ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සංචාරක හෝ චාරිකා කර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාර කටයුතු කිරීම සඳහා ආණ්ඩුවේ අනුයෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් සඳහා පහසුකම් සැලසීමෙහි නිරත වීම, ඊට සහාය වීම හෝ එය ප්‍රවර්ධනය කිරීම හා සංචාරක ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම ;

(ඇ) සංචාරක කර්මාන්තය සමඟ සම්බන්ධ සේවා ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා මෙහෙයවීම සහ එම සේවා සංචාරකයන්ට ලබාදෙන තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ;

(ඈ) සංචාරක හා චාරිකා කර්මාන්තයේ යෙදෙන විවිධ ව්‍යවසාය විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිති නියම කිරීම, විධිමත් කිරීම, පවත්වාගෙන යාම හා බලාත්මක කිරීම ;

(ඉ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය යුතු නිර්ණායක මත විවිධ ව්‍යවසායවලට බලපත්‍ර දීම හා ඊට අදාළ වන නියම හා කොන්දේසි නියම කිරීම ;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම, කුලියට දීම, ඔඩපනය කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම : එසේ වුව ද, නිශ්චල දේපළ බැහැර කිරීම අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව පමණක් කරනු ලැබිය හැකි ය.

(උ) එහි කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීමේ අවශ්‍යතාව උද්ගතවන කවර විටෙක දී වුව ද, දේශීය හා විදේශික උපදේශකයින් යෙදවීම ;

(ඌ) අවශ්‍යතාවයක් පැන නැගී ඇති කවර විටක දී වුව ද, සංචාරක කර්මාන්තයට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් පළාත්බද බලධරයන් සමඟ සබඳතා ගොඩනංවා ගැනීම ;

(එ) උපකාරක කර්මාන්ත හා සේවා සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ඊට සහාය දීම ;

(ඒ) පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා සමාගම් හෝ වෙනත් මණ්ඩල පිහිටුවීම ;

(ඔ) පනතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ ඇති සංචාරකයන්ගේ සිත්ගත් ස්ථානවල චාරිකා කරන තැනැත්තන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමේ ව්‍යාපාරය කරගෙන යාම ;

(ක) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව—

(i) සංචාරක කර්මාන්තයේ පරමාර්ථවලට සරිලන පරිදි එම කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත දී වැඩි දියුණු කිරීම සඳහා සිවු අවුරුදු සැලැස්මක් සහ වෙනත් අදාළ සැලසුම් සහ වැඩසටහන් විධිමත් ලෙස සකස් කිරීම ;

(ii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කෙරෙන හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා හිතකර වන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ යම් ව්‍යාපාරයක අධිකාරියේ මුදල් ආයෝජනය කිරීම ;

(iii) අධිකාරියේ කර්තව්‍ය සියල්ල හෝ ඉන් කිසිවක් කිරීමේ අරමුණින්, යම් තැනැත්තකු සමග යම් හවුල් ව්‍යවසායකට එළඹීම හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක් පිහිටුවීම ;

(ග) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව—

(i) අධ්‍යක්ෂවරුන් හෝ උපදේශකයන් පත් කිරීම මගින් හෝ වෙනත් තැනැත්තන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංචාරක ව්‍යවසායන් කළමනාකරණය කිරීම, පාලනය කිරීම හෝ අධීක්ෂණය කිරීම ;

(ii) අයිරා මගින්, ණය වශයෙන් හෝ අන්‍යාකාරයකින්, අධිකාරියේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම ;

(iii) සංචාරක හෝ චාරිකා සේවාවල නිරත වීමට අදහස් කරගෙන සිටින තැනැත්තන්ට, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව ප්‍රදාන, ණය සහ අන්‍යාකාරයෙන් මූල්‍යමය සහාය ලබා දීම ;

(ච) අධිකාරිය විසින් සලසනු ලබන සේවා, පහසුකම් හෝ උපකරණ සඳහා බදු සහ වෙනත් ගාස්තු අය කිරීම ;

(ජ) මේ පනත යටතේ හෝ මේ පනත මගින් අධිකාරිය සතුකර ඇති, අධිකාරිය වෙත පවරා ඇති හෝ අභිනියෝජනය කර ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම ; සහ

(ට) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ කිරීමට අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

අධිකාරියේ විශේෂ කාර්ය.

**13**. පහත දැක්වෙන දේ කිරීම අධිකාරියේ කාර්යය වන්නේ ය :—

(අ) අමාත්‍යවරයාගේ ඉල්ලීමක් මත හෝ අධිකාරියේ මෙහෙයවීමෙන් සංචාරක හා චාරිකා කර්මාන්තයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු පිළිබඳව සංචාරක හා චාරිකා කර්මාන්තය සහ වෙනත් ආශ්‍රිත ව්‍යවසායවලට උපදෙස් දීම ;

(ඇ) සංචාරක ස්ථාන හා සංචාරක සේවා පිහිටුවීම, විධිමත් කිරීම. අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම හා පාලනය කිරීම සහ ඒවායේ හෝ ඒවා හා සම්බන්ධ සේවයෙහි නියුක්ත තැනැත්තන් පිළිබඳ වූ යෝජනා ක්‍රම පිළියෙල කර, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ; සහ

(ඇ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වූ යෝජනා අමාත්‍යවරයාගේ මඟ පෙන්වීම සඳහා ක්‍රමවත්ව සකස් කිරීම.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික සහ සේවා නියම හා කොන්දේසි.

**14**. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුපාතවලට අනුව හා යම් ආකාරයකට සහ යම් සේවා නියම හා කොන්දේසිවලට යටත් ව, අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

**15**. (1) පනත යටතේ අධිකාරිය හා කමිටු වෙත පවරනු ලැබ හෝ භාර කරනු ලැබ ඇත්තා වූ බලතල, කර්තව්‍ය හා කාර්ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකනු ලබන යම් නිලධරයන් හා සේවකයන්, අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානවලට යටත් ව, අධිකාරිය විසින්—

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලය පත්කිරීම, සේවයෙන් පහකිරීම හා ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) (අ) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ ද කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(ආ) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ඇ) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ඇ) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරන යම් කාලයක් එකී ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා රජයට සේවය කළ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ දෙපාර්තමේන්තු සහ කමිටු.

**16**. (1) අධිකාරියේ කටයුතු නිසි ලෙස හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි සළකනු ලැබිය හැකි යම් දෙපාර්තමේන්තු අධිකාරිය විසින් පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද එක් එක් දෙපාර්තමේන්තුවට පැවරිය යුතු කාර්ය හා කර්තව්‍ය අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ කටයුතු ඉටුකිරීමේ දී එයට සහායවීම සඳහා, එහි සාමාජිකයන්ගෙන් හෝ නිසි විශේෂඥ දැනුමක් ඇති වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත කමිටු සංඛ්‍යාවක් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධිකාරිය විසින පත්කරනු ලැබිය හැකි ය. ඒ කමිටු සියලු අවස්ථාවන්හි දී ම අධිකාරියේ සාමාජිකයකුගේ ප්‍රධානත්වයෙන් විය යුතු ය.

(4) අධිකාරිය විසින්, ඒ කමිටුවල කර්තව්‍ය දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය.

රීති සෑදීම සඳහා අධිකාරිය සතු බලතල.

**17**. (1) රීති සෑදිය යුතු යයි බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අධිකාරිය වෙත සතු කරනු ලැබ ඇත්තා වූ හෝ පවරනු ලැබ ඇත්තා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හා ඉටුකිරීමට අදාළ රීති අධිකාරිය විසින් සාදනු ලැබිය හැකි ය.

(2) පළමු වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය. එවැනි සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

අධිකාරිය, අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බව.

**18**. (1) අධිකාරිය විසින්, එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීමට අදාළව පනතේ විධිවිධානවලට අනනුකූල නොවන පොදු ප්‍රතිපත්තිමය විධාන අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා, අධිකාරිය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන එවැනි යම් විධාන, අධිකාරිය විසින් බලාත්මක කරනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ කටයුතු හා දේපළවලට අදාළව, අමාත්‍යවරයාට කලින් කල අවශය විය හැකි යම් තොරතුරු ද අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

## II වන පරිච්ඡේදය

## මුදල් සහ ගිණුම්

**19**. (1) අධිකාරියේ සාමාන්‍ය මූල්‍ය කටයුතු සඳහා අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අරමුදලට— අධිකාරියේ අරමුදල.

(අ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ ;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත මගින් හෝ ඒ යටතේ අධිකාරිය වෙත පවරන ලද යම් බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන නියෝග හෝ රීති යටතේ අධිකාරිය විසින් අයකරනු ලබන සියලු බදු, ගාස්තු හා අයකිරීම් ;

(ඇ) අධිකාරිය වෙත පැවරුනු හෝ එය විසින් පරිපාලනය කරනු ලබන යම් දේපළකින් අධිකාරියට ලැබෙන සියලු ආදායම් ;

(ඈ) අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන්ගෙන් අධිකාරියට ලැබෙන සියලු ආදායම් ;

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් යම් බලයලත් අනුයෝජිතයකු විසින් සපයනු ලබන සේවාවන් සඳහා සහ පනතෙහි ප්‍රකාශිත කාර්ය සඳහා අධිකාරිය විසින් දෙනු ලබන යම් සහතිකයක්, බලපත්‍රයක් හෝ අනුමතයක් සඳහා අයකිරීම් වශයෙන් ලැබෙන සියලු මුදල් ; සහ

(ඊ) අධිකාරියේ බැරට අන්‍යාකාරයෙන් උපචිත වන වෙනත් සියලු මුදල් ප්‍රමාණ,

ගෙවනු ලැබිය යුතු ය.

(2) අරමුදලින් යම් මුදල් ප්‍රමාණයක් ආපසු ගැනීම සඳහා, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධිකාරිය විසින් රීති සාදනු ලැබිය යුතු අතර, ඒ රීතිවලට අනුකූලව හැර, කිසිම මුදලක් අරමුදලින් ආපසු නොගත යුතු ය.

**20**. (1) අධිකාරිය විසින්, එහි වත්කම් හා බැරකම්, ආදායම හා වියදම සහ ආයතනයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම් විගණනය.

(2) අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) (අ) යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට, අධිකාරිය විසින්, පනතේ පරමාර්ථ වැඩි දියුණු කිරීම සඳහා ගනු ලැබූ පියවර පිළිබඳ සවිස්තර වාර්තාවක් ඇතුළත්, ආයතනයේ කටයුතු පරිපාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාව,පහත දැක්වෙන ලේඛන ද සමග අමාත්‍යවරයා වෙත යැවීමට කටයුතු සැලැස්විය යුතු ය :—

(i) අදාළ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව ;

(ii) අදාළ වර්ෂය සඳහා ශේෂ පත්‍රය ; සහ

(iii) අදාළ වර්ෂය සඳහා ලාභ හා අලාභ ගිණුම ;

(ආ) (අ) ඡේදය යටතේ තමා වෙත එවන ලද වාර්තාවේ හා ලේඛනවල පිටපත් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(4) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(5) අවශ්‍ය යයි විගණකාධිපතිවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, මේ වගන්තිය මගින් නියමිත වාර්තා හා ගිණුම් පිළියෙල කිරීමේ දී සහාය වීම සඳහා, විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමට අධිකාරියට බලය ඇත්තේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ (8) වන ඡේදයෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන්, රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

**21**. අධිකාරියේ සෑම සාමාජිකයකු ම, නිලධරයකු ම, හා සේවකයකු ම (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**22**. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව තේරුම් ගත යුතු ය.

(26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

III වන පරිච්ඡේදය

## සංචාරක සංවර්ධන අරමුදල

**23**. (1) මෙහි පහත දක්වනු ලබන විධිවිධානවලට සහ ඒ සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිත කළ යුතු (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සංචාරක සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් මේ පනතේ කාර්ය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

සංචාරක සංවර්ධන අරමුදල පිහිටුවීම.

(2) පළමු වන උපවගන්තිය මගින් පිහිටුවනු ලැබූ අරමුදලට—

(අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 වන වගන්තිය ප්‍රකාර අපගමන බද්ද වශයෙන් එකතු කරනු ලබන මුදල් ප්‍රමාණයෙන් තුනෙන් එකක මුදල් ප්‍රමාණයක් ; සහ

(ආ) මේ පනත මගින් හෝ ඒ යටතේ ඒ අරමුදලට ගෙවීමට නියමිත සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදලට—

(අ) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ සංවර්ධනය උදෙසා සාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ සංවර්ධනය කිරීමේ දී යම් සංවිධානයක් හෝ යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) ඒ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ (8) වන ඡේදයට අනුකූලව විගණනය කරනු ලැබිය යුතු ය.

(5) අරමුදලේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සංචාරක සංවර්ධන බද්දක් අය කිරීම.

**24**. (1) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍රලත් සෑම ආයතනයක ම පිරිවැටුම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2003 අංක 25 දරන මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාර, සංචාරක සංවර්ධන බද්දක් පනවා, අයකොට, එකතු කළ යුතු ය.

(2) බද්ද පැනවීම, බද්ද ගෙවීමේ ක්‍රමය හා ඒ බද්ද එකතු කිරීමට අදාළ වාර්තා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත සැපයිය යුතු ආකාරය සම්බන්ධයෙන් 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා අධිකාරිය විසින් රීති සාදනු ලැබිය යුතු ය.

(4) ඉහත සඳහන් විධිවිධාන ප්‍රකාරව අය කරන ලද බද්ද එක් එක් සේවා සැපයුම්කරුවන් විසින් පිළිවෙලින් රෙජිස්ටරයකට ඇතුළත් කළ යුතු අතර, එම සේවා සැපයුම්කරුවන් විසින් වෙන වෙනම පවත්වාගෙන යනු ලබන ගිණුම්වල බදු වශයෙන් ගෙවන මුදල් නිසි ලෙස ගිණුම්ගත කරනු ලැබ තිබිය යුතු ය.

(5) බදු වශයෙන් රැස්කරන ලද සියලු ම මුදල් ප්‍රමාණවල විස්තර නියමිත ආකාරයෙන් ඇතුළත් කරන ලද මාසික ප්‍රකාශයක්, එක් එක් සේවා සැපයුම්කරුවන් විසින් පසුව එළඹෙන මාසයේ පහළොස් වන දිනයේ දී හෝ එදිනට පෙර, අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) අධිකාරිය විසින් අය කරනු ලබන බද්ද වශයෙන් සලකා රැස්කරන ලද සියලුම මුදල්, (5) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි මාසික ප්‍රකාශය අධිකාරියට භාරදීමෙන් දින පහළොවක් ඇතුළත, අධිකාරියට ගෙවනු ලැබිය යුතු ය.

(7) පස්වන සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එම විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(8) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු ආකාරයෙන් රැස් කරන ලද මුදල්, 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද

සංචාරක සංවර්ධන අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, අරමුදලේ බැරට ඇති සියලු මුදල් පහත දැක්වෙන ආකාරයට වැය කරනු ලැබිය යුතු ය :—

(අ) සියයට හැත්තෑවක (70%) ප්‍රමාණයකින් යුත් මුදලක් 40 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය;

(ආ) සියයට දොළහක (12%) ප්‍රමාණයකින් යුත් මුදලක් 33 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවනු ලැබිය යුතු ය;

(ඇ) සියයට දාහතරක (14%) ප්‍රමාණයකින් යුත් මුදලක් අධිකාරියට ගෙවනු ලැබිය යුතු ය;

(ඈ) සියයට හතරක (4%) ප්‍රමාණයකින් යුත් මුදලක් 42 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය.

(9) බදු ආකාරයෙන් රැස් කරනු ලැබ, (8) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයෙන් වැය කරනු ලැබ ඇති මුදල්, ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ඊට අදාළ අළෙවි කටයුතු කිරීම සම්බන්ධව ගෙවීම් කිරීමේ කාර්ය සඳහා හුදෙක් ම භාවිත කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## IV වන පරිච්ඡේදය

## සංචාරක සංවර්ධන ප්‍රදේශ

**25**. 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත, යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් තුළ හා ඒ හා සම්බන්ධයෙන් අධිකාරියට බලසීමාවක් තිබිය යුතු ය. ප්‍රකාශිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියට බලසීමාවක් තිබිය යුතු බව.

**26**. (1) අමාත්‍යවරයා විසින්, අධිකාරියේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් (මෙහි මින් මතු "ප්‍රදේශයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ප්‍රදේශයක් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

(2) පළමු වන උපවගන්තිය යටතේ යම් නිර්දේශයක් කිරීමට පෙර, අධිකාරිය විසින්, එකී ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ වෙනත් යම් පරදු තබන්නන් වෙත නියම කරනු ලැබිය යුතු ආකාරයට නිසි පරිදි දැනුම්දීමෙන් පසු ප්‍රසිද්ධ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය.

(3) පළමු වන උපවගන්තිය ප්‍රකාර ප්‍රකාශිත යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය. ඒ ප්‍රදේශය ඇතුළත වූ පහසුකම් පිළිබඳ ලැයිස්තු හා සංචාරකයන්ගේ සිත් ඇදගන්නා ස්ථාන ලෙස හැඳිනිය හැකි ඓතිහාසික හෝ පාරිසරික රුචිය ඇතිකරන ස්ථාන ද එකී නියෝගවලට ඇතුළත් කළ හැකි වන්නේ ය.

සංචාරක සංවර්ධන ප්‍රදේශවලට අදාළ නියම.

**27**. (1) 26 වන වගන්තිය ප්‍රකාර පළ කරනු ලබන සෑම නියමයක ම එසේ ප්‍රකාශිත ප්‍රදේශයේ හෝ ප්‍රදේශවල මායිම් සඳහන් විය යුතු ය. ප්‍රදේශයකට යම් ජාතික නිවාඩු නිකේතනයක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන වෙනත් යම් ප්‍රදේශයක් ඇතුළත් විය හැකි ය.

(2) 26 වන වගන්තිය ප්‍රකාර වූ සෑම නියමයක් ම අවුරුදු දහයක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතු ය.

(3) 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රදේශයක් ප්‍රකාශයට පත්කරනු ලැබූ විට, යම් අදාළ නීතියකින් යම් තැනැත්තකුට, පුද්ගල මණ්ඩලයකට හෝ අධිකාරියකට පවරා හෝ පනවා හෝ භාරදී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය ඉහත කී ලිඛිත නීතියේ නිශ්චිතව සඳහන් අදාළ බලධාරීන් විමසා, අවශ්‍යවනතාක් දුරට සහ එකඟ වූ ප්‍රමාණයට, 26 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කළ ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම කරනු ලැබිය හැකි ය.

(4) අධිකාරිය විසින්, නියෝග මගින් —

(අ) 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුළත වූ යම් ප්‍රදේශයකට ප්‍රවේශ වීම සඳහා අදාළ වූ කොන්දේසි සඳහන් කරනු ලැබිය හැකි ය. කෙසේ වුව ද ඒ නියෝගය ප්‍රකාශයට පත් කරන අවස්ථාවේ දී පැවති පොදු පාරවල්, ප්‍රසිද්ධ ස්මාරක, වන්දනීය ස්ථාන, මහජන උද්‍යාන, රජයේ කාර්යාල, පාසැල්, බෙහෙත් ශාලා සහ වෙනත් පොදු ස්ථාන හා ආණ්ඩුව, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් සපයනු ලබන පහසුකම් ද සම්බන්ධයෙන් ඒ නියෝග අදාළ නොවිය යුතු ය ;

(ආ) එකී ප්‍රදේශ තුළට ඇතුලුවන තැනැත්තන්ට ආරක්ෂාව සහ නිරුපද්‍රතාව සැපයීමේ හා එකී ප්‍රදේශ ඇතුළත සෞඛ්‍ය

තර්ජන වැළැක්වීමට හා අඩු කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයාගේ මතය අනුව සංචාරක කර්මාන්තයකට එළඹෙන්නා වූ ද, ඒ නිසා එකී ප්‍රදේශය හෝ නිකේතනය ඇතුළත තහනම් කිරීම අවශ්‍ය වන්නා වූ ද වාණිජ ක්‍රියාකාරකම් වර්ග සඳහන් කරනු ලැබිය හැකි ය ;

(ඇ) සිත් ඇද ගන්නා භූමි දර්ශන හා විනෝද විය හැකි ස්ථාන ද ඇතුලුව, සංචාරකයන්ගේ භාවිතය සඳහා ප්‍රදේශයක් තුළ ඇති පහසුකම් හා භූමි දර්ශන පිළිබඳව,සඳහන් කරනු ලැබිය හැකි ය.

26 වන වගන්තිය යටතේ ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත රහස්‍යභාවය රැකීම.

**28**. (1) 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුළත, ඒ ප්‍රදේශයේ ඇති පහසුකම් වෙනත් යම් තැනැත්තකු භුක්ති විඳීමෙන් වළක්වන හෝ එසේ භුක්තිවිඳීම වැළකෙන යම් ආකාරයකින් ක්‍රියා කරන හෝ වෙනත් යම් තැනැත්තකුගේ පුද්ගලිකත්වයට මැදිහත් වෙමින් යම් ක්‍රියාවක් කරන, නැතහොත් 27 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) හා (ආ) ඡේද යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිපන් දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) මේ කොටසේ කාර්ය සඳහා “පුද්ගලිකත්වය” යන්නට, 26 වන වගන්තිය ප්‍රකාර සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත ඇත්තා වූ පරිසරය සහ පහසුකම් හා සේවා සාධාරණ තැනැත්තකු විසින් වරදකාරී යයි සලකනු ලැබිය හැකි අන්දමට යම් තැනැත්තකුගේ පුද්ගලික ජීවිතයට කෙරෙන බාහිර මැදිහත්වීම්වලින් තොරව තනිව භුක්තිවිඳීමට ඔහුට ඉඩ හරිනු ලැබීම සඳහා එම තැනැත්තාට ඇති අයිතිය ඇතුළත් වේ.

ජාතික පාරිසරික පනත හා පුරා වස්තු ආඥාපනත යටතේ වූ බලතල අධිකාරිය වෙත පැවරිය යුතු බව.

**29**. (1) 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විටෙක, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත යටතේ පාරිසරික සැලසුම් හා පුරාවස්තු සුරැකීම සඳහා අවශ්‍ය සියලු බලතල, ප්‍රකාශිත ප්‍රදේශය ඇතුළත සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට, අවුරුදු දහයක කාලයක් සඳහා අධිකාරිය වෙත පැවරිය යුතු ය.

(2) පළමු වන උපවගන්තිය ප්‍රකාර අධිකාරිය වෙත බලය පවරනු ලැබ ඇත්තා වූ යම් කාරණයක් සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙහි නිර්දේශ නියමිත කාලය ඇතුළත අධිකාරියට ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

(3) (අ) 26 වන වගන්තිය ප්‍රකාර, ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විටෙක, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ප්‍රදේශය ඇතුළත පාරිසරික සැලසුම් සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන නිර්ණායක නියම කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පරිසර විෂයය භාර අමාත්‍යවරයා විමසා නියෝග සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. මේ සම්බන්ධයෙන්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා යම් නිර්දේශ ඉදිරිපත් කළ යුතු කාලය නියම කරන ලද පරිදි විය යුතු ය.

(ආ) අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සමග එකඟ නොවන්නේ නම්, කාරණය පරිසර විෂයය භාර අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ ඒ අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය. එවැනි යම් කරුණක් සලකා බලනු ලබන සියලු අවස්ථාවන්හි දී අදාළ එක් එක් කමිටුවේ සාමාජිකයකු පෙනී සිටිය යුතු යයි නියම කරනු ලැබිය යුතු ය.

(ඇ) අමාත්‍යවරයා විසින්, පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නිර්දේශ කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා එවැනි යම් නිර්දේශයක් කළ යුතු කාලය නියම කෙරෙන, අවශ්‍ය විය හැකි යම් නියෝග සාදනු ලැබිය යුතු ය.

(ඈ) 26 වන වගන්තිය යටතේ එසේ ප්‍රකාශිත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත පාරිසරික සැලසුම් සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු නිර්ණායක නියම කෙරෙන නියෝග, පරිසර විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය යුතු ය.

(4) (අ) 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විටෙක, (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත ප්‍රකාර, ඒ ප්‍රදේශය ඇතුළත ඒ පුරාවස්තු ඇති ස්ථානවල දී නැරඹීමට පැමිණෙන්නන්ට පහසුකම් ලබා දීම සම්බන්ධයෙන්, අධිකාරිය විසින් බලතල ක්‍රියාත්මක කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. මේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධිකාරිය විසින් පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අනුමතිය ලබා ගත යුතු ය. ඒ අනුමතිය ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරන ලද පරිදි විය යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින්, පුරාවස්තු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව 26 වන වගන්තිය යටතේ ප්‍රකාශිත පරිදි වූ යම් සංචාරයක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත පුරා වස්තු සංරක්ෂණය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි යම් නියෝග සාදනු ලැබිය යුතු ය.

(5) ඒ පිළිබඳ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කළ යුතු ප්‍රමාණය හා ආකාරය සහ ඒවා අදාළ කළ යුත්තේ කවුරුන් විසින් ද යන බව සඳහන් කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය. එවැනි යම් නියෝගයක්, අදාළ විෂයය භාර අමාත්‍යවරයා විමසා සාදනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ "මධ්‍යම පරිසර අධිකාරිය" යන්නෙන්1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

**30**. 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුළත භාවිත කිරීම සඳහා දිගු ගමන් ප්‍රදේශ හා ස්වභාවික දඩයම් පාරවල් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු අතර, හඳුනා ගත යුතු ය. නියෝග මගින් නියමිත ගාස්තු, දිගු ගමන් ප්‍රදේශ හා දඩයම් පාරවල් භාවිත කරන තැනැත්තන්ගෙන් අය කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රදේශ භාවිත කළ යුතු ආකාරය ද නියම කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින්, අදාළ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නියෝග සාදනු ලැබිය යුතු ය.

දිගු ගමන් ප්‍රදේශ හා ස්වභාවික දඩයම් පාරවල් ප්‍රකාශයට පත් කිරීම.

**31**. අධිකාරිය විසින්, 26 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ඇති සියලු බලතල අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ක්‍රියාත්මක කළ යුතු ය.

අධිකාරිය විසින් බලතල ක්‍රියාත්මක කිරීම.

## III වන කොටස

## V වන පරිච්ඡේදය

## සංචාරක උපදේශක කමිටුව

**32**. (1) චාරිකා සහ සංචාරක කර්මාන්තයට සම්බන්ධ කාරණා පිළිබඳව අමාත්‍යවරයාට සහ අධිකාරියට උපදෙස් දීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංචාරක උපදේශක කමිටුව යනුවෙන් හැඳින්වෙන පුද්ගල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

සංචාරක උපදේශක කමිටුව පිහිටුවීම.

(2) උපදේශක කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන පහත සඳහන් සාමාජිකයන්ගෙන්—

(i) අධිකාරියේ සභාපතිවරයා ;

(ii) 33 වන වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සභාපතිවරයා ;

(iii) 41 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලබන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිවරයා;

(iv) ජාතික ගුවන් සේවයේ ප්‍රධාන විධායක නිලධරයා.

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලෝක චාරිකා, සංචාරක කර්මාන්තය සහ අදාළ කාර්මාන්ත හා සම්බන්ධ පුළුල් පළපුරුද්දක් හා සුදුසුකම් ඇති, තැනැත්තන් පස් දෙනකුට නොඅඩු හා එකොලොස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවක්.

(3) එම තැනැත්තන් අතරින් එක් තැනැත්තකු උපදේශක කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) උපදේශක කමිටුවේ කවර හෝ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) සංචාරක හා චාරිකා කර්මාන්තයේ අනාගත ගමන් මග හා උපාය මාර්ග පිළිබඳව උපදෙස් දීම සහ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම උපදේශක කමිටුවේ කාර්යය විය යුතු ය.

(6) උපදේශක කමිටුවේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කමිටුවට විශේෂ හෝ පොදු විධාන ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි අතර, උපදේශක කමිටුව විසින් එම විධාන බලාත්මක කළ යුතු ය.

(7) අධිකාරිය විසින් උපදෙස් සඳහා යම් කාරණා උපදේශක කමිටුව වෙත යොමු කළ හැකි අතර, උපදේශක කමිටුව එහි උපදෙස්, හැකි කෙටිම කාලය ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(8) උපදේශක කමිටුවේ සාමාජියන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය ; එසේ වුව ද, ඉල්ලා අස්වන හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(9) කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(10) (අ) උපදේශක කමිටුවේ කවර සාමාජිකයකු විසින් වුව ද අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටුකිරීමට සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු එසේ නොපැමිණ සිටින කාලසීමාව සඳහා ඔහු වෙනුවට සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(11) මේ කොටස යටතේ ස්වකීය කාර්ය කරගෙන යාමේ දී උපදේශක කමිටුවට සහාය වීම පිණිස අවශ්‍ය නිලධරයන් හෝ සේවකයන්, උපදේශක කමිටුව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පත්කරගත හැකි ය.

(12) අවශ්‍ය අවස්ථාවල දී, උපදේශක කමිටුවේ සාමාජිකයන්ට සහ වෙනත් නිලධරයන්ට හා සේවකයන්ට, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් ගෙවිය හැකි ය.

## VI වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල කළමනාකරණ ආයතනය

**33**. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල කළමනාකරණ ආයතනය යනුවෙන් හැඳින්වෙන පුද්ගල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු අතර, එම නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල කළමනාකරණ ආයතනය පිහිටුවීම.

**34**. ආයතනයේ පරමාර්ථ වන්නේ — ආයතනයේ පරමාර්ථ.

(අ) සංචාරක කර්මාන්තයේ නියුක්ත පිරිස් සඳහා පුහුණුව සැපයීම අවශ්‍ය වී ඇති සහ වඩාත්ම සුදුසු ශාස්ත්‍රීය හා වෘත්තීය පුහුණුකරන්නන් ලබාගැනීම අත්‍යවශ්‍ය වී ඇති සංචාරක කර්මාන්තයට සම්බන්ධ අංශ හඳුනා ගැනීම ;

(ආ) හඳුනාගත් අධ්‍යයන ක්ෂේත්‍රවල විෂයමාලා සංවර්ධනය ;

(ඇ) සංචාරක කර්මාන්තයට සම්බන්ධ විෂයයන් පිළිබඳව, සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා අවශ්‍ය තාක් දුරට තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සැපයීම ;

(ඈ) සංචාරක කර්මාන්තයට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සම්බන්ධ කාර්යයන්හි නිරතවීම සඳහා පුද්ගලයන් පුහුණු කරන දේශීය හා විදේශීය තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඉ) ආයතනයෙන් ලබාගත් සුදුසුකම්වල ස්වභාවය දැක්වෙන සහභාගිත්වය පිළිබඳ සහතික එක් එක් පුද්ගලයාට ප්‍රදානය කිරීම ;

(ඊ) සංචාරක කර්මාන්තයට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සම්බන්ධ පාසැල් හා අභ්‍යාස මධ්‍යස්ථානවල අයිතිය දැරීම, ඒවා කළමනාකරණය කිරීම සහ එම පාසල් හා අභ්‍යාස මධ්‍යස්ථානවල අයිතියට හා කළමනාකරණයට සහභාගි වීම ; සහ

(උ) මේ පනතින් හෝ මේ පනත යටතේ නැතහොත් තත්කාලීනව බලපවත්නා වෙනත් යම් නීතියකින් හෝ නීතියක් යටතේ ආයතනය වෙත පැවරී හෝ භාරවී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ආයතනයේ පරමාර්ථ සපුරා ගැනීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම වේ.

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය.

**35**. (1) ආයතනයට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු අතර, ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය එම මණ්ඩලයට භාර විය යුතු ය.

(2) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන්, එනම් –

(අ) ආයතනයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබන තැනැත්තාගෙන් ;

(ආ) 36 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(ඇ) 10 වන වගන්තිය යටතේ පත්කරනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(ඈ) සංචාරක කර්මාන්තය, චාරිකා සහ හෝටල කළමනාකරණය පුහුණු කිරීම යන ක්ෂේත්‍රවල දැනීමක් ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනකුගෙන් ;

(ඉ) 40 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගෙන් ;

(ඊ) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය (ටුවරිස්ට් හොටෙල්ස් ඇසෝෂියේෂන් ඔf්ප් ශ්‍රී ලංකා), ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමය (ට්‍රැවල් ඒජන්ට්ස් ඇසෝෂියේෂන් ඔf්ප් ශ්‍රී ලංකා) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය (ශ්‍රී ලංකා ඉන්බවුන්ඩ් ටුවර් ඔපරේටර්ස් ඇසෝෂියේෂන්) සහ හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය (හෝටල් ස්කූල් ග්‍රැජුවේට්ස් ඇසෝෂියේෂන්) යන සංගම් විමසා අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන ආකාරයට පත් කරනු ලබන, තැනැත්තන් හය දෙනකුගෙන් :—

(i) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයෙන් (ටුවරිස්ට් හොටෙල්ස් ඇසෝෂියේෂන් ඔf්ප් ශ්‍රී ලංකා) නියෝජිතයන් දෙදෙනකු ;

(ii) ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමයෙන් (ට්‍රැවල් ඒජන්ට්ස් ඇසෝෂියේෂන් ඔf්ප් ශ්‍රී ලංකා) නම් කරනු ලබන එක් තැනැත්තකු ;

(iii) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමයෙන් (ශ්‍රී ලංකා ඉන්බවුන්ඩ් ටුවර් ඔපරේටර්ස් ඇසෝෂියේෂන්) නම් කරනු ලබන එක් තැනැත්තෙක් ;

(iv හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමයෙන් (හෝටල් ස්කූල් ග්‍රැජුවෙට්ස් ඇසෝෂියේෂන්) නාමිකයන් දෙදෙනකු ; සහ

(උ) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහුගේ නියෝජිතයාගෙන්,

සමන්විත විය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

**36**. (1) ආයතනයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයා විසින්, ආයතනයේ මණ්ඩලයේ නිර්දේශය මත පත් කරන අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) මණ්ඩලයේ අනුමතය ඇතිව ආයතනය විසින් පත් කරනු ලබන, අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය ; සහ

(ඇ) ආයතනයේ කර්තව්‍ය සාර්ථකව කරගෙන යාම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්.

(2) මෙහි ඉහත (අ) ඡේදය යටතේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, ආයතනයේ කාර්ය මණ්ඩලය ආයතනයේ පරිපාලනය හා කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු ය. තව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා පවරා දෙන කාර්යයන්, මණ්ඩලයේ නිර්දේශය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරන ආකාරයකට ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(4) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්—

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම හා ඔවුන් සේවයෙන් පහකිරීම ද ඔවුන්ගේ විනය පාලනය පවත්වා ගැනීම ද ;

(ආ) වෙළෙඳපලෙහි පවත්නා ගෙවීම් ප්‍රමාණයන් කෙරෙහි නිසි සැලකිල්ල ඇතිව, කාර්ය මණ්ඩලයේ වේතන සහ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ද,

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි හා නියමයන් නිශ්චය කිරීම ද,

කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය යනාදිය.

**37**. (1) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය : එසේ වුව ද, ඉල්ලා අස්වන හෝ අන්‍යාකාරයකින් ධුරය හිස්කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(2) යම් තැනැත්තෙක්, කවර හෝ පන්තියකට හෝ විස්තරයකට අයත් සංචාරක සේවා සඳහා සහ හෝටල් කළමනාකරණය පිළිබඳව පුහුණුව සපයන යම් ව්‍යාපාරයක අයිතිකරුවකු, හවුල්කරුවකු, අධ්‍යක්ෂවරයකු, බහුතර කොටස් හිමියකු හෝ සේවා නියුක්තයකු වේ නම් හෝ ඒ තත්වයට පත්වුවහොත් හෝ ඒ තැනැත්තා, ආයතනයේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබීමට හෝ කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙක් විය යුතු ය.

(3) කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(4) මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) මණ්ඩලයේ කවර සාමාජිකයකු විසින් වුව ද, අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ධුරයේ කාර්ය ඉටුකිරීමට සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු එසේ නොපැමිණ සිටින කාලසීමාව සඳහා ඔහු වෙනුවට සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(6) මේ කොටස යටතේ මණ්ඩලයේ කාර්ය කරගෙන යාමට මණ්ඩලයට සහාය වීම පිණිස, අවශ්‍ය නිලධරයන් හෝ සේවකයන්, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, මණ්ඩලය විසින් පත්කර ගත හැකි ය.

(7) අවශ්‍ය අවස්ථාවල දී මණ්ඩලයේ සාමාජිකයන්ට සහ වෙනත් නිලධරයන්ට සහ සේවකයන්ට අධිකාරිය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික, අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

හෝටල් පාසල ආයතනය වෙත සතු විය යුතු බව.

**38**. (1) 1966 අංක10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද හෝටල් පාසල මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට ආයතනය සතු වන්නේ ය.

(2) හෝටල් පාසල ආයතනය වෙත සතුවන දින දී හෝටල් පාසලට අයත් සියලු චංචල හා නිශ්චල දේපළ ආයතනය වෙත පැවරෙන්නේ ය.

(3) හෝටල් පාසැලේ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සැලකිය යුතු ය.

(4) හෝටල් පාසැලේ බැරට තිබෙන සියලු මුදල් 19 වන වගන්තිය යටතේ පිහිටුවන අරමුදලට මාරු කළ යුතු ය.

ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලය.

**39**. (1) ආයතනය විසින් අමාත්‍යවරයා විමසා ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලයක් පත් කළ යුතු ය. එම මණ්ඩලය එහි සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයකුගෙන් සහ තවත් සාමාජිකයන් හතර දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(2) ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලය ආයතනයේ ශාස්ත්‍රීය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය. ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන හෝ මෙහෙයවනු ලබන යම් පාසැලක පරිපාලනය ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලය වෙත පැවරිය යුතු ය.

(3) (අ) ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලයට සාමාජිකයන් පත් කරන ආකාරය සහ ආයතනය යටතේ ඇති පාසැල් පරිපාලනය කළ යුතු ආකාරය ; සහ

(ආ) සංචාරක කර්මාන්තය සහ හෝටල් පරිපාලනය පිළිබඳ පුහුණුව සැපයීම සඳහා පෞද්ගලික අයිතිය සහිත හෝටල් පාසැල් පිහිටුවීම, කළමනාකරණය කිරීම හෝ මෙහෙයවීම සඳහා අපේක්ෂා කරන තැනැත්තන් සඳහා අවශ්‍ය නිර්නායක හා එම පාසැල් පරිපාලනය කළ යුතු ආකාරය,

නියම කරන නියෝග සෑදිය හැකි ය.

## VII වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

**40**. (1) (මෙහි මින් මතු “කාර්යාංශය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන පුද්ගල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු අතර එම නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(2) කාර්යාංශය පහත සඳහන් තැනැත්තන්ගෙන්, එනම් —

(අ) කාර්යාංශයේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තාගෙන් ;

(ආ) 10 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(ඇ) කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගෙන් ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහුගේ නියෝජිතයාගෙන්; සහ

(ඉ) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමය (ශ්‍රී ලංකා ඇසෝෂියේෂන් ඔෆ් ඉන් බවුන්ඩ් ටුවර් ඔපරේටර්ස්) සහ ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ (ටුවරිස්ට් හොටෙල්ස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා) ඒකාබද්ධ සභාවේ නාමිකයන් වන හය දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින්; සහ

(ඊ) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයාගෙන්,

සමන්විත විය යුතු ය.

(3) සභාපතිවරයා ලෙස පත්කරනු ලබන තැනැත්තා, සංචාරක කර්මාන්තයට අදාළ වන තාක් දුරට, අළෙවිකරණය සහ ප්‍රචාරණය පිළිබඳ දැනීමක් හා පළපුරුද්දක් සහිත තැනැත්තකු විය යුතු ය.

(4) කාර්යාංශයට පහත සඳහන් පරමාර්ථ තිබිය යුතු ය :—

(අ) අධිකාරියේ උපදෙස් විමසා සංචාරක සංවර්ධන සැලැස්මට අනුකූලව විශිෂ්ට සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස ඍජුව හෝ වක්‍රව ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රයේ අළෙවිකරණය සහ ප්‍රවර්ධනය;

(ආ) දකුණු ආසියා කලාපයට දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම; සහ

(ඇ) කලාපයේ විශිෂ්ට සංචාරක කර්මාන්ත කළමනාකරණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රකට භාවයට පත් කිරීම.

(5) අමාත්‍යවරයා විසින් කලින් කල පවරා දෙනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යාංශයට භාර වන අතර සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා සලකා කලින් කල පවරනු ලබන වෙනත් යම් කාර්ය හා කර්තව්‍ය ද ඊට භාර වන්නේ ය.

(6) කාර්යාංශයට පැවරෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම සඳහා අධිකාරිය විසින් කාර්යාංශයට වාර්ෂිකව මුදලක් වෙන් කර දෙනු ලබන අතර, එසේ වෙන් කර දෙන මුදලින් උපරිම ප්‍රයෝජනය ගැනීම කාර්යාංශයේ වගකීම වන්නේ ය.

(7) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම, තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු කළමනාකාර අධ්‍යක්ෂවරයකුට භාර වන්නේ ය. කළමනාකාර අධ්‍යක්ෂ ධුරයට පත් කරනු ලබන තැනැත්තාට තිබිය යුතු සුදුසුකම් සහ වෙනත් නිර්ණායක නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(8) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ අළෙවි කිරීම හා සම්බන්ධව කාර්යාංශයේ කාර්යන් කාර්යක්ෂමව කරගෙන යාමේ කාර්යය සඳහා කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශවල ද කාර්යාල පවත්වාගෙන යා යුතු ය.

(9) එක් එක් ලිත් වර්ෂයේ අවසානයේ සිට මාස තුනක කාලසීමාවක් ඉකුත් වීමට පෙර, කාර්යාංශය විසින් අමාත්‍යවරයා වෙත—

(අ) එම වර්ෂය තුළ කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක් ;

(ආ) ප්‍රවර්තන වර්ෂයේ තුන් මසක් ඇතුළත ඊට පූර්ව ලිත් වර්ෂය සඳහා වූ විගණනය කළ ගිණුම් වාර්තාවේ පිටපතක් සහ ලිත් වර්ෂයේ හත්වන මාසයේ අවසානයට පෙර අර්ධ වාර්ෂික ගිණුම්;

(ඇ) ඊළඟ ලිත් වර්ෂය සඳහා එහි ආදායම් හා වියදම් ඇස්තමේන්තුවක් වන, අමාත්‍යවරයා විසින් නිශ්චිතව නියම කරන විස්තර අඩංගු ප්‍රකාශයක්;

(ඈ) කාර්යාංශය ඉටුකර ගැනීමට අපේක්ෂා කරන, ඉතිරි තුන් අවුරුදු කාලසීමාවකට ප්‍රක්ෂේපිත සැලැස්මක්;

(ඉ) පූර්ව වර්ෂය සඳහා ඉදිරිපත් කළ සැලැස්මට අදාළ සාර්ථකත්වය හා කාර්ය සාධනය අන්තර්ගත ප්‍රකාශයක්,

ඉදිරිපත් කළ යුතු ය.

41. (1) කාර්යාංශයේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය. එසේ වුව ද, ඉල්ලා අස්වන හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි වී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය. කාර්යාංශයේ සාමාජිකයන්ගේ ධුර කාලය යනාදිය.

(2) යම් තැනැත්තෙක් කවර හෝ පන්තියකට හෝ විස්තරයකට අයත් සංචාරක සේවා මෙහෙයවීමේ හෝ සැපයීමේ යම් ව්‍යාපාරයක අයිතිකරුවකු, හවුල්කරුවකු, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු, බහුතර කොටස් හිමියකු හෝ සේවා නියුක්තයකු වේ නම්, නැතහොත් ඒ තත්වයකට පත් වුවහොත් හෝ ඒ තැනැත්තා කාර්යාංශයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීමට හෝ කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙක් විය යුතු ය.

(3) කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් විය යුතු ය.

(4) (අ) කාර්යාංශයේ කවර සාමාජිකයකු විසින් වුව ද, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වි ය හැකි ය.

(ආ) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, සාමාජිකයකුට ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු එසේ නොපැමිණ සිටින කාලසීමාව සඳහා ඔහු වෙනුවට සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(5) මේ කොටස යටතේ කාර්යාංශයේ කාර්ය කරගෙන යාම සඳහා කාර්යාංශයට සහාය වීමට අවශ්‍ය යම් නිලධරයන් හෝ සේවකයන් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව කාර්යාංශය විසින් පත් කර ගත හැකි ය.

(6) අවශ්‍ය අවස්ථාවල දී කාර්යාංශයේ සාමාජිකයන්ට සහ වෙනත් නිලධරයන්ට හා සේවකයන්ට අධිකාරිය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික, අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

## VIII වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

**42**. (1) (මෙහි මින් මතු "සම්මේලන කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන පුද්ගල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් වන අතර, එම නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

(2) සම්මේලන කාර්යාංශයේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකාව ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් ලෙස සහ පොළඹවන සුළු චාරිකා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම;

(ආ) ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් වශයෙන් හා පොළඹවන සුළු චාරිකා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම සඳහා සැළසුම් කළ පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම;

(ඇ) ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සම්බන්ධීකරණය කිරීම හා ඊට සහාය දීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් ඒ සඳහා සේවා සැපයීම;

(ඈ) සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සාර්ථකව පැවැත්වීම සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශීය සම්මේලන, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවිධායකයන් සමග සම්බන්ධීකරණය සහ සහයෝගීතාව පවත්වා ගැනීම ;

(ඉ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන් වල විවිධ අංශවල නිරතව සිටින තැනැත්තන්ට සහ සංවිධානවලට වෘත්තීයමය ප්‍රමිති නියම කිරීම සහ එම ප්‍රමිති පවත්වාගැනීම බලාත්මක කිරීම ;

(ඊ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා පිළිබඳ විවිධ අංශවල කටයුතු කිරීමෙහි නියැළී සිටින විවිධ ගණවල තැනැත්තන්ගේ හෝ සංවිධානවල වෘත්තීය නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(උ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටින යම් සංගම් හෝ සංවිධාන සමග අනුබද්ධවීම, ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීම හෝ ඒ යම් සංගම් හෝ සංවිධාන සමග ගිවිසුම්වලට ඇතුළත්වීම;

(ඌ) ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපළෙහි අළෙවි කිරීම සඳහා කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම;

(එ) සත්කාරක සේවා ඇතුලුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවා, අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ආකාරයට සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඒ) කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ආනුෂංගික හෝ හිතකර සියලු ක්‍රියා සහ දේ ශ්‍රී ලංකාවෙහි හෝ අන් ස්ථානවල සිදුකිරීම.

**43**. (1) සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු හා දහතුන් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සංයුක්ත කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු ය. සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය.

(2) මෙහි පහත සඳහන් තැනැත්තන්, කළමනාකරණ මණ්ඩලයේ නම් කළ සාමාජිකයන් විය යුතු ය :—

(i) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ හා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(ii) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ (ටුවරිස්ට් හොටෙල්ස් ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා) සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(iii) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ (ශ්‍රී ලංකා ඇසෝසියේෂන් ඔෆ් ඉන් බවුන්ඩ් ටුවර් ඔපරේටර්ස්) සභාපතිවරයා හෝ එම සංගමයේ උප සභාපතිවරයා ;

(iv) කොළඹ නගරයේ සංචාරක හෝටල් සංගමයේ (කලම්බු සිටි ටුවරිස්ට් හොටෙල්ස් ඇසෝසියේෂන්) සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(v) ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ප්‍රධාන සභාපතිවරයා හෝ එම සංගමයේ උප සභාපතිවරයා ;

(vi) ශ්‍රී ලංකා වෘත්තීයවේදී සංගම් සංවිධානයේ සභාපතිවරයා හෝ එම සංගමයේ උප සභාපතිවරයා ;

(vii) ෆෙඩරේෂන් ඔෆ් චේම්බර්ස් ඔෆ් කොමර්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රි ඔෆ් ශ්‍රී ලංකා සංගමයේ සභාපතිවරයා ;

(viii) සංචාරක සංවර්ධන අධිකාරියෙහි මණ්ඩලයේ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන තැනැත්තා ;

(ix) 10 වන වගන්තිය යටතේ පත්කරන ලද, සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(x) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ පාලක මණ්ඩලය විසින් නම් කරන ලද සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ විධායක නිලධරයෙක් හෝ ජ්‍යෙෂ්ඨ විධායක නිලයට අඩු නොවන නිලයක් දරන නිලධරයෙක් ;

(xi) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන තැනැත්තන් දෙදෙනෙක් ; එක් තැනැත්තකු එම අමාත්‍යාංශයේ නිලධරයකු විය යුතු ය.

(2) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින්, සම්මේලන කාර්යාංශයේ සභාපතිවරයා, (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයන් වන තැනැත්තන් අතරින්, නම් කරනු ලැබිය යුතු ය. සභාපතිවරයා අවුරුදු තුනක කාලසීමාවක් ධුරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකු මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණ නොසිටියහොත් සහ ඔහු විකල්ප සාමාජිකයකු මගින් නියෝජනය නොවුවහොත්, ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කිරීමට සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයට බලය ඇත්තේ ය.

(4) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි, සංචාරක කර්මාන්තයේ ඌන නියෝජනයක් සහිත අංශයක් නියෝජනය කරන සංගමයක සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද එම සාමාජිකයාට ඡන්දය පාවිච්චි කිරීමේ හිමිකම නොමැති විය යුතු ය.

(5) සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ට යම් පාරිශ්‍රමයක් ගෙවීම, අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය යුතු ය.

(6) සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයකුට සෘජු සම්බන්ධතාවක් පවතින කොන්ත්‍රාත්තුවක් පිළිබඳව හෝ ඒ කොන්ත්‍රාත්තුව මගින් උද්ගත වන යම් කාරණයක දී, ඒ සාමාජිකයා ඡන්දය පාවිච්චි නොකළ යුතු අතර, ඔහු එසේ ඡන්දය පාවිච්චි කළහොත් ඔහුගේ ඡන්දය ගණන් නොකළ යුතු ය.

44. කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයකු— නුසුදුසුකම්.

(අ) බංකොලොත්භාවයට හෝ වස්තු භංගත්වයට පත් වුවහොත් හෝ පොදුවේ ඔහුගේ ණය හිමියන් සමග යම් වැඩපිළිවෙලකට හෝ සමථයකට ඇතුළත් වුවහොත් ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ කරනු ලැබූ නියමයක් හේතුකොට ගෙන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකුව සිටීමේ තහනමකට ලක් වුවහොත් ; හෝ

(ඇ) සිහිවිකල බවට පත් වුවහොත් ; හෝ

(ඈ) සම්මේලන කාර්යාංශය වෙත එවන ලියවිල්ලකින් වූ දැනුම් දීමක් මගින් ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ; හෝ

(ඉ) සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරීම පනතට අනුකූලව නතර වුවහොත්,

සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ ඔහුගේ සාමාජික ධුරය හිස් වන්නේ ය.

සම්මේලන කාර්යාංශයේ සාමාන්‍යාධිකාරි වරයා.

**45**. සම්මේලන කාර්යාංශය විසින් සම්මේලන කාර්යාංශයේ සාමාන්‍යාධිකාරි ධූරය සඳහා තැනැත්තකු සේවයේ නියුක්ත කළ යුතු ය. සාමාන්‍යාධිකාරිවරයා කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර සාමාන්‍යාධිකාරිවරයා සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා නියමයන්, කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චිතව දැක්වීම කළ යුතු ය.

කළමනාකරණ මණ්ඩලයේ විකල්ප සාමාජිකයෝ.

**46**. (1) සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු වෙනුවට කළමනාකරණ මණ්ඩලයට පත්කරනු ලබන තැනැත්තකු "විකල්ප සාමාජිකයකු" යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) විකල්ප සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ තැනැත්තකු එම පත්වීම සම්බන්ධයෙන් සම්මේලන කාර්යාංශයෙන් කිසිදු පාරිශ්‍රමිකයක් ලබා නොගත යුතු ය. එසේ වුව ද සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය විසින් විකල්ප සාමාජිකයකුට සහභාගිවීමට හිමිකම තිබෙන සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීම සහ ඒ රැස්වීම්වල සිට ආපසු යාම වෙනුවෙන් ඔහු විසින් දරනු ලැබිය හැකි සාධාරණ වියදම් හෝ ඒ සාමාජිකයා සම්මේලන කාර්යාංශයේ කටයුතුවල දී හෝ ඒවාට අදාළව අන්‍යාකාරයෙන් දරන වියදම් ප්‍රතිපූරණය කිරීම, නැතහොත් එකී වියදම් වෙනුවෙන් යෝග්‍ය යයි සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය අදහස් කරන දීමනාවක් ගෙවීම සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය විසින් කළ හැකි ය.

(3) අදාළ කළමනාකරණ මණ්ඩල සාමාජිකයා විසින් 44 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව නම් කළ විකල්ප සාමාජිකයකුට සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සියලු රැස්වීම් පිළිබඳ නිවේදන ලැබීමට ද, ඔහුව පත්කරන්නා පැමිණ නොසිටින සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වී එහි සාමාජිකයකු වශයෙන් ඡන්දය දීමට ද, ඔහුව පත්කරගන්නා නොමැතිවිට දී එම පත්කරන්නාගේ සියලු කර්තව්‍ය පොදුවේ ඉටු කිරීමට ද හිමිකම තිබිය යුතු ය.

(4) විකල්ප සාමාජිකයකු යම් නිශ්චිත කාලසීමාවක් සඳහා හෝ යම් නිශ්චිත සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස හෝ යම් නිශ්චිත සංසිද්ධියක් දක්වා හෝ පත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) විකල්ප සාමාජිකයකු පත්කරගන්නා, සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම නතර වුවහොත් ; හෝ

(ආ) විකල්ප සාමාජිකයා ඔහුගේ ණය හිමියන් සමග සමථයකට එළඹුනහොත් ; හෝ

(ඈ) විකල්ප සාමාජිකයා ලියවිල්ලකින් වූ නිවේදනයක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ; හෝ

(ඇ) සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ විකල්ප සාමාජිකයකු උන්මත්තකයකු බවට හෝ සිහිවිකල තැනැත්තකු බවට පත් වුවහොත් ; හෝ

(ඉ) සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයට විකල්ප සාමාජිකයකුගේ පත්වීම, ඔහුගේ පත්කරන්නා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් අවලංගු කරනු ලැබුවහොත්,

ඒ සාමාජිකයා සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම නතර වන්නේ ය.

**47**. සම්මේලන කාර්යාංශයට, සංචාරක සංවර්ධන බදු වශයෙන් එකතු කරන ලද මුළු මුදලෙන් සියයට හතරක් (4%) සහ සම්මේලන කාර්යාංශයේ කර්තව්‍ය කාර්යක්ෂමව කරගෙන යාම සඳහා ආණ්ඩුවෙන් වෙන් කර දෙන වෙනත් යම් මුදල් ලැබිය යුතු ය. කාර්යාංශයේ මුදල්.

## IV වන කොටස

## IX වන පරිච්ඡේදය

## සංචාරක ව්‍යවසායයන් සහ සංචාරක සේවා ලියාපදිංචි කිරීම සහ සංචාරක සේවා සම්බන්ධයෙන් වූ මිල, ගාස්තු, රේට් ප්‍රමාණ සහ අයකිරීම් විධිමත් කිරීම

**48**. (1) අධිකාරියේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සංචාරක හා චාරිකා කර්මාන්තයේ ක්‍රියාත්මක වන ඇතැම් ව්‍යාපාර සහ සේවා, පිළිවෙලින් සංචාරක ව්‍යවසාය සහ සංචාරක සේවා වශයෙන් වර්ග කරනු ලැබිය හැකි ය. සංචාරක ව්‍යවසාය සහ සංචාරක සේවා ප්‍රකාශ කිරීම සහ ලියාපදිංචි කිරීම.

(2) මෙම වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(3) පළමු වන උපවගන්තිය ප්‍රකාර සිදු කරන ලද වර්ගීකරණයට ඇතුළත් වන්නා වූ සෑම සංචාරක ව්‍යවසායක් සහ සංචාරක සේවාවක් ම අධිකාරිය වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් වෙනස් වූ වර්ගීකරණයනට අනුව, ඒ ව්‍යවසායයේ හෝ සේවාවේ නමින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. අධිකාරිය විසින් බලපත්‍රලත්

සංචාරක ව්‍යවසාය හා සංචාරක සේවා පිළිබඳ නාම ලේඛනයක් පවත්වා ගෙන යා යුතු ය. අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ආකාරය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) මේ වගන්තිය ප්‍රකාර අධිකාරිය වෙත ලියාපදිංචි වී ඇත්නම් මිස, කිසිදු සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් ව්‍යාපාර කරගෙන නොයා යුතු ය. ලියාපදිංචි නොකර හෝ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබ ව්‍යාපාරය කරගෙන යනු ලබන යම් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර ඒ ලියාපදිංචි කිරීම සහ බලපත්‍රය අවලංගු කිරීමට යටත් වන්නේ ය.

(5) ඒ බලපත්‍ර දීම සහ ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු කලින් කල ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(6) දෙවන උපවගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද බලපත්‍රයක් නියෝග මගින් නියම කරනු ලැබූ කාලසීමාවන් සඳහා වලංගු විය යුතු අතර, බලපත්‍ර අළුත් කිරීම නියම කරනු ලැබ ඇති කාර්ය පටිපාටියට අනුව කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යම් බලපත්‍රලත් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවාවක් විසින් සලස්වනු ලබන සේවාවල අවම ප්‍රමිති පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවට යටත් විය යුතු ය.

(8) අධිකාරිය විසින්—

(අ) බලපත්‍රය අපේක්ෂා කරනු ලබන සේවය සැලසීමට ඊට ඇති ශක්‍යතාව හා හැකියාව දක්වා සිටිමින් බලපත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව, සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් විසින් අධිකාරිය වෙත සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට අදාළව ; සහ

(ආ) ඊට නිකුත් කර ඇති බලපත්‍රය යටතේ බලපත්‍රලත් සංචාරක ව්‍යවසායක් විසින් හෝ සංචාරක සේවයක් විසින් සලස්වනු ලබන සේවය පිළිබඳව පරීක්ෂා කිරීම් කර ගෙන යා යුතු ආකාරයට අදාළව හා එම සේවය නියාමනය කිරීමට අදාළව,

රීති සෑදිය යුතු ය.

(9) මේ වගන්තිය ප්‍රකාර බලපත්‍රලත් සෑම සංචාරක ව්‍යවසායයක් සහ සංචාරක සේවයක් විසින්ම, එය විසින් සලස්වාලනු ලබන සේවාවට අදාළව පළ කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකට, සංදේශනයකට හෝ වෙනත් නිවේදනයකට, එය මේ වගන්තියේ ප්‍රකාර බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති ලියාපදිංචි කළ සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් බවට ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය.

(10) ලියාපදිංචි නොකළ යම් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් විසින් එය ලියාපදිංචි කළ සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් බවට පෙනී සිටීම වරදක් වන්නේ ය.

චර්යා සංග්‍රහ නියම කිරීමට අමාත්‍යවරයාට ඇති බලතල.

**49**. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ උපදෙස් මත පහත සඳහන් සියලු සංචාරක ව්‍යවසායන්, චාරිකා සේවාවන් හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු චර්යා සංග්‍රහ නියම කරමින්, නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) සංචාරක හෝටල් ;

(ආ) චාරිකා ඒජන්තවරු ;

(ඇ) සංචාරක නියමු කථිකාචාර්යවරු ;

(ඈ) (ඉහත සඳහන් කිසිවක් යටතට නොගැනෙන සේවාවන්ගෙන් සමන්විත සංචාරක සේවාවක් වන්නා වූ) අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා හඳුනාගනු ලැබිය හැකි නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා.

(2) මේ වගන්තිය ප්‍රකාර සකස් කරනු ලබන චර්යා සංග්‍රහවල සඳහන් යම් කාරණාවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්සීයක දඩයකට ඔහු යටත් වන්නේ ය.

සංචාරක ව්‍යවසායයන් හා චාරිකා සේවා කලින් කල වර්ග කළ යුතු බව.

**50**. (1) අධිකාරියේ උපදේශ මත අමාත්‍යවරයා විසින් සංචාරක ව්‍යවසාය සහ සංචාරක සේවා පන්තීන් වර්ග කළ හැකි අතර, එවැනි යම් ව්‍යවසායයක් හෝ සේවයක් විසින් පවත්වා ගෙන යා යුතු ප්‍රමිති කලින් කල නියම කරනු ලැබිය හැකි ය.

(2) සංචාරක ව්‍යවසාය සහ සංචාරක සේවය පිළිබඳ පන්ති අමාත්‍යවරයා විසින් වර්ග කරනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ වර්ග කරන ලද යම් සංචාරක ව්‍යවසායන් හෝ සංචාරක සේවා පන්තියකට ප්‍රමිති පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) යම් සංචාරක ව්‍යාවසායක් හෝ සංචාරක සේවයක් විසින් සපයනු ලබන යම් සේවයක් ඒ වෙත නිකුත් කර ඇති ප්‍රමිති පිළිබඳ සහතිකයේ නිශ්චිතව සඳහන් ප්‍රමිතියට අඩු තත්ත්වයේ පවතින බව සොයාගනු ලැබුවහොත්, ඒ ව්‍යාවසාය හෝ සේවය විසින් එහි ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා සහ සහතිකයේ නිශ්චිතව සඳහන් ප්‍රමිතිය ලබා කර ගැනීම සඳහා ගත යුතු පියවර අධිකාරිය විසින් හඳුන්වා දිය හැක. අධිකාරිය විසින් හඳුන්වා දෙනු ලබන ඒ පියවර අනුව ක්‍රියා කිරීම යම් ව්‍යාවසායක් හෝ සේවයක් විසින් පැහැර හැරියහොත්, ඒ ව්‍යාවසායයට හෝ සේවයට නිකුත් කර ඇති සහතිකය අධිකාරිය විසින් වහාම අවලංගු කළ යුතු ය.

අභියාචන.

**51**. 43 වන වගන්තියේ (2) වන උපවගන්තිය අනුව බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවා වූ හෝ 45 වන වගන්තියේ නියම අනුව සහතිකය අවලංගු කරනු ලැබුවා වූ යම් තැනැත්තකු විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරන ලද අභියාචන විනිශ්චයාධිකාරයක් වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය. විනිශ්චයාධිකාරයේ සංයුතිය සහ විනිශ්චයාධිකාරයක් විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ ලාංඡනය.

**52**. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ ලාංඡනය විය යුතු ලාංඡනයක් නියම කළ යුතු ය. නිසිලෙස ලියාපදිංචි වී සිටින සංචාරක සහ චාරිකා ව්‍යාවසායයන්හට නියම කරනු ලබන ආකාරයට ඒ ලාංඡනය භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට බලය දෙනු ලැබිය හැකි ය.

(2) කිසිදු තැනැත්තකු විසින් අධිකාරියේ අවසරය නොමැතිව අධිකාරියේ ලාංඡනය භාවිත කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(3) අධිකාරියේ අවසරය නොමැතිව අධිකාරියේ ලාංඡනය භාවිත කරන හෝ ප්‍රදර්ශනය කරන නැතහොත් තුන්වන පාර්ශ්වයක් නොමග යවන සුළු හෝ ව්‍යාකූලත්වයට පත් කරන ආකාරයෙන් අධිකාරියේ ලාංඡනයට බෙහෙවින් සමීපස්ථව නියෝජනය කෙරෙන ලාංඡනයක් හෝ ලකුණක් භාවිත කරන හෝ ප්‍රදර්ශනය කරන තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

මිල නියෝග නියමය.

**53**. (1) අධිකාරියේ සභාපතිවරයා විසින්, අධිකාරියේ සාමාජිකයන්ගේ නිර්දේශය මත, එසේ කිරීම උචිත යයි ඔහුට පෙනී යන අවස්ථාවක, අවශ්‍ය යයි පෙනෙන්නා වූ විමසීම් කිරීමෙන් පසු නියමයක්

මගින්, යම් සංචාරක සේවයක් සැපයීම සඳහා පනවනු ලබන, නියම කරනු ලබන, ඉල්ලා සිටිනු ලබන හෝ අයකරනු ලබන මිල, ගාස්තු රේට් ප්‍රමාණ හෝ අයකිරීම් විධිමත් කරනු ලැබිය හැකි ය. එම නියෝගය මේ පනතේ “මිල නියෝග නියමය” ලෙස සඳහන් කරනු ලැබේ.

(2) යම් මිල නියෝග නියමයක්—

(අ) ශ්‍රී ලංකාව පුරාම ඇති සංචාරක සේවා විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට සැලැස්විය යුතු ය. නැතහොත් එය ක්‍රියාත්මකවීම, නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකාවෙහි යම් ස්ථානයක හෝ ප්‍රදේශයක සංචාරක සේවාවලට සීමා කරනු ලැබිය හැකි ය ;

(ආ) එය අදාළ කිරීම නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් සංචාරක සේවා විස්තරයකට සීමා කරනු ලැබිය හැකි ය ;

(ඇ) එමගින් වෙනස් වූ විස්තරවල සංචාරක සේවා සම්බන්ධයෙන් වූ හෝ එකම විස්තරයක සංචාරක සේවාවල වෙනස් වූ සංචාරක සේවා වර්ග සම්බන්ධයෙන් වූ මිල, ගාස්තු රේට් ප්‍රමාණ හෝ අය කිරීම් විධිමත් කරනු ලැබිය හැකි ය ; සහ

(ඈ) එමගින්, සපයනු ලබන සේවයෙහි හෝ පහසුකම්වල තත්ත්වය සහ ප්‍රමිතිය සම්බන්ධ කොන්දේසි ද ඇතුළත්ව, එවැනි යම් සේවා විසින් පනවනු, අයකරනු හෝ ඉල්ලා සිටිනු ලැබිය හැකි හෝ අයකරනු ලැබිය හැකි මිල, ගාස්තු, රේට් ප්‍රමාණ හෝ අයකිරීම් යටත් විය යුතු කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

(3) (අ) මේ වගන්තියේ මීට ඉහතින්ම වූ විධිවිධාන මගින් පවරන ලද, බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් මිල නියෝග නියමයක් කිරීමේ දී, එම විස්තරයේම වෙනත් යම් පන්තියක සංචාරක සේවයකට වඩා වැඩි උපරිම මිල, රේට් ගණන්, ගාස්තු හෝ අයකිරීම් පැනවීමට, ලබා ගැනීමට, ඉල්ලා සිටීමට හෝ අයකිරීමට යම් එක් පංතියක සංචාරක සේවයක යම් විස්තරයකට හැකි බවට තහවුරු කිරීමේ අවශ්‍යතාවයට මූලික වශයෙන් සැලකිල්ල දැක්විය යුතු ය.

(ආ) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා යම් විස්තරයක යම් චාරිකා හෝ සංචාරක සේවයකට අදාළව "පන්තිය" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ නීතියෙන් නියම කර ඇති පරිදි තත් කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන රෙජිස්ටරයෙහි එම සේවයට වෙන්කර ඇති හෝ දී ඇති වර්ගීකරණය වේ.

(4) සෑම මිල නියෝග නියමයක්ම, අධිකාරියේ සභාපතිවරයා විසින් සාදනු ලැබ අත්සන් කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය.

(5) යම් මිල නියෝග නියමයක් අධිකාරියේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබීමෙන් පසු—

(අ) ගැසට් පත්‍රයේ ඒ නියමය ප්‍රසිද්ධ කිරීමෙන් ; සහ

(ආ) මේ පනත යටතේ තත් කාර්ය සඳහා සාදන ලද නියෝග මගින් නියමිත වෙනත් යම් ආකාරයකින්,

වහාම ඒ පිළිබඳව මහජන දැනුම්දීම කරනු ලැබිය යුතු ය.

(6) සෑම මිල නියෝග නියමයක් ම එය ක්‍රියාත්මක වූ දිනයේ හෝ සති දෙකක කාලය ඇතුළත අමාත්‍යවරයා විසින් සලකා බැලීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉන්පසු අමාත්‍යවරයා විසින් ඒ නියමය අනුමත කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(7) හය වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් යම් මිල නියෝග නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ අවස්ථාවක, ඒ පරිච්ඡින්න කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එලෙස ප්‍රසිද්ධ කරන ලද දිනයේ සිට එය පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය ; එහෙත් ඒ යටතේ කරන ලද හෝ දරන ලද කිසිවකට හෝ අත්කරගත්, උපචිත වූ හෝ ලබන ලද යම් අයිතියකට, බැඳීමකට හෝ වගකීමකට අගතියක් නොවිය යුතු ය.

(8) යම් මිල නියෝග නියමයක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(9) ඉහත දැක්වෙන විධිවිධාන අනුව සාදන ලද යම් මිල නියෝග නියමයක් කලින් කල සංචාරක සහ චාරිකා කර්මාන්තයෙහි යහපත අරභයා සංශෝධනය කළ හැකි ය ; නැතහොත් වෙනස් කළ හැකි ය.

(10) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම මිල නියෝග නියමයක් ම අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියට පමුණුවනු ලැබිය යුතු අතර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

**54**. (1) යම් මිල නියෝග නියමයක් තත් කාලයෙහි ක්‍රියාත්මකව පවතින අවස්ථාවක, ඒ නියමය අදාළ වන්නා වූ සෑම සංචාරක සේවයක අයිතිකරු හෝ කළමනාකරු විසින්— මිල නියෝග නියමයක් කිරීමෙන් ඇතිවන බැඳීම්.

(අ) ඒ අයිතිකරු හෝ කළමනාකරු විසින් සලස්වනු ලබන සහ නියමයේ සඳහන් වන එක් එක් සේවාව සම්බන්ධයෙන් අය කරනු ලබන මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යාම හෝ පවත්වාගෙන යාමට සැලැස්වීම හෝ කළ යුතු ය ;

(ආ) ඒ රෙජිස්ටරය අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් තැනැත්තකු විසින් පරීක්ෂාකර බලනු පිණිස තැබිය යුතු ය ; නැතහොත් එසේ තැබීමට සැලැස්විය යුතු ය ; සහ

(ඇ) ඒ නියමයේ සඳහන් වන මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ ලැයිස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධාන කරනු ලබන පරිදි වූ ආකාරයට හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

## V වන කොටස

## X වන පරිච්ඡේදය

## සාමාන්‍ය කරුණු

**55**. යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ ගෙනෙනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් නීත්‍යානුකූලව දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අය කර ගන්නා ලද යම් වි යදමක් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය. සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් ගෙවීම.

**56**. අධිකාරියට විරුද්ධව ගෙනෙනු ලබන යම් නඩුවක දී අධිකාරියේ සාමාජිකයකුට එරෙහිව ශරීරයට හෝ දේපළවලට එරෙහිව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය. අධිකාරියේ යම් සාමාජිකයකුට විරුද්ධව රිට් ආඥාවක් නොපැවතිය යුතු බව.

සාධන පත්‍ර බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු බව.

**57**. අධිකාරිය විසින් නිකුත් කරන ලද්දේ යයි උද්දේශිත වූ ද මේ පනතින් නියම කර ඇති පරිදි මුද්‍රා තබනු ලැබිය යුතු හෝ අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් අත්සන් කරනු ලැබිය යුතු වූ ද සෑම සාධන පත්‍රයක් ම සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර එය එම කරුණ සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස සැලකිය යුතු ය.

අධිකාරිය විසින් තොරතුරු ඉල්ලා සිටිය හැකි බව.

**58**. අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් මේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සංචාරක හෝ වෙනත් යෝජනා ක්‍රම සකස් කිරීමට අධිකාරියට හැකිවනු පිණිස අවශ්‍ය විය හැකි සියලු කාරණාවලට අදාළ සියලු වාර්තා හෝ තොරතුරු දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් තුළ දී අධිකාරිය වෙත හෝ තත්කාර්ය සඳහා බලය දෙන ලද නිලධරයා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

අධිකාරිය විසින් ඉඩම් ආදියට ඇතුල්විය හැකි බව.

**59**. මේ පනත යටතේ අධිකාරිය වෙත පැවරී ඇති හෝ පනවනු ලැබ ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්ය ඉටුකිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, මේ සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයාට කරනු ලැබූ ඉල්ලීමක් මත ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමකට හෝ ඉදිකිරීමක් තුළට ඇතුල්විය හැකි අතර, යම් එවැනි කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ පරීක්ෂා කර බැලීම්, සමීක්ෂණ, විභාග කිරීම් හෝ පරීක්ෂණ කරනු ලැබිය හැකි ය.

දැන්වීම ආදිය භාරදීමේ ආකාරය.

**60**. (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක් යටතේ යම් තැනැත්තකු වෙත භාරදිය යුතු බවට නියම කෙරෙන යම් දැන්වීමක්, නියමයක්, සාධන පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක්—

(අ) ඒ තැනැත්තා වෙත ගොස් භාරදීමෙන් ; හෝ

(ආ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් සිටින හෝ ඒ තැනැත්තා අන්තිමට පදිංචිව සිටි ස්ථානය ලෙස දන්නා ස්ථානයෙහි නැතහොත් ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක ඒ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලයෙහි තැබීමෙන්,

භාර දෙනු ලැබිය හැකි ය.

(2) පළමු වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව භාර දෙන ලද යම් ලේඛනයක්, එහි ලිපිනය ලියා ඇත්තේ කවරකු වෙත ද ඒ තැනැත්තා වෙත නිසි ලෙස භාර දුන් ලෙස සැලකිය යුතු ය.

61. (1) යම් චාරිකා හෝ සංචාරක සේවයක සේවා නියුක්තිය ලැබීමට කැමති යම් තැනැත්තකු විසින්, තත් කාර්යය සඳහා සාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව ඒ සඳහා සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු ලෙස අධිකාරිය වෙත ලියාපදිංචි විය යුතු ය.

චාරිකා හෝ සංචාරක සේවාවල සේවානියුක්තිය ලැබීමට කැමති තැනැත්තන් අධිකාරිය වෙත ලියාපදිංචි විය යුතු බව.

(2) අධිකාරිය වෙත ලියාපදිංචි නොවී චාරිකා හෝ සංචාරක සේවයක සේවානියුක්තියෙහි නිරත යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

62. (1) රීති සෑදිය යුතු බවට මේ පනතින් බලය දී ඇත්තා වූ හෝ නියම කර ඇත්තා වූ සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

රීති සෑදීමට අධිකාරියට ඇති බලය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදන ලද කිසිදු රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් ක්‍රියාත්මක නොවිය යුතු ය. එවැනි සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

63. (1) (අ) මේ පනත යටතේ හෝ මේ පනතේ කාර්ය සඳහා හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියමයක් යටතේ හෝ සාදන ලද හෝ සපයනු ලබන යම් ඉල්ලීමක, වාර්තාවක හෝ වෙනත් ලේඛනයක දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නා වූ ; හෝ

වැරදි.

(ආ) මේ පනතින් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ ; හෝ

(ඇ) මේ පනතින් හෝ ඒ යටතේ නැතහොත් ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තකු වෙත පැවරී ඇති හෝ පනවනු ලැබ ඇති යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නා වූ,

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන්නා වූ සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නඩු පැවරීම පිණිස අධිකාරියේ අවසරය ලැබිය යුතු බව.

**64**. අධිකාරියේ ලිඛිත අවසරය ඇතිව හැර මේ පනත යටතේ වූ වරදක් සඳහා කිසිදු අධිකරණයක නඩු පවරනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි.

**65**. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක–

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරද සඳහා වරදකරුවකු ලෙස සැලකිය යුතු ය :

එසේ වුව ද, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා නැතහොත් ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරු විසින්, ඒ වරද ඔහුගේ දැනුමෙන් තොරව කර ඇති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරන්නේ නම් ඒ වරද සඳහා ඔහු වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

වැරදි සමථයට පත්කිරීම.

**66**. (1) මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා, අවසන් නොවූ නඩු කටයුත්තක් නොපවතින්නේ නම්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් චූදිතයා විසින් ගෙවීම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ වරද සඳහා නඩු කටයුත්තක් සත්‍ය වශයෙන් ම අවසන් නොවී පවතින්නේ නම්, මහෙස්ත්‍රාත්වරයාගේ එකඟත්වය ඇතිව එසේ සමථයට පත්කිරීම සඳහා හේතු වාර්තාගත කිරීමෙන් පසු ; අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එලෙස සමථයට පත් කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීමෙහි නිදොස් කිරීමක ප්‍රතිඵලය ඇත්තේ ය.

(3) වරදක් සමථයට පත් කිරීමේ කාර්යය සඳහා චූදිත තැනැත්තකු විසින් ගෙවනු ලබන මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත ඉවත් කිරීම.

**67**. (1) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඒ ඉවත් කිරීම ක්‍රියාත්මක වන දිනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

(2) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත ඉවත් කරනු ලැබුවේ වුව ද—

(අ) පනත ඉවත් කරන ලද දිනයට ඉහතින්ම වූ දිනයේ දී ලංකා සංචාරක මණ්ඩලය වෙත පැවරී තිබුණු සියලු චංචල හා නිශ්චල දේපළ එකී ඉවත් කිරීම සඳහා නියම කරන ලද දින සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත පැවරිය යුතු ය ;

(ආ) ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ඒ සමග ඇතුළත් වී ඇත්තා වූ ද එකී පනත ඉවත් කරන ලද දිනයට ඉහතින් ම වූ දිනයේ දී වලංගුව පැවතියා වූ ද සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ඉවත් කිරීම සඳහා නියමිත දිනයේ බලපැවැත්වෙන පරිදි අධිකාරිය විසින් සහ අධිකාරිය සමග ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ, පනත ඉවත් කරන ලද දිනයට ඉහතින් ම වූ දිනයේ දී නිම නොවී පැවති සියලු නඩු හා නඩු කටයුතු පනත ඉවත් කිරීම සඳහා නියමිත දිනය සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ නඩු සහ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඉදිරියට පවත්වාගෙන ගොස් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය ;

(ඈ) පනත ඉවත් කරන ලද දිනයට ඉහතින් ම වූ දිනයේ දී ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් වූ සියලු තැනැත්තන් ඉවත් කිරීම සඳහා නියමිත දිනයේ සිට, අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) පනත ඉවත් කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ලංකා සංචාරක මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව දෙනු ලැබ සම්පූර්ණ නොකරන ලද සියලු තීන්දු හා කරනු ලැබ සම්පූර්ණ නොකරන ලද සියලු නියම, පනත ඉවත් කිරීම සඳහා නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ වාසියට හෝ අධිකාරියට විරුද්ධව දෙන ලද තීන්දුවක් හෝ කරන ලද නියමයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය ;

(ඊ) පනත ඉවත් කරන ලද දිනයට ඉහතින් ම වූ දිනයේ දී ලංකා සංචාරක මණ්ඩලය විසින් පාලනය සහ කළමනාකරණය කරමින් පැවති සියලු පුහුණු කිරීමේ පාසැල් සහ ආයතන නියමිත දිනයේ සිට ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය වෙත පැවරුණු ලෙස සැලකිය යුතු ය.

(3) 1966 අංක 10 දරන සංචාරක මණ්ඩලය පනත ඉවත් කිරීමට පෙර එකී පනතේ විධිවිධාන ප්‍රකාර නිකුත් කරන ලද අවසර පත්‍ර සහ බලපත්‍ර මේ පනත යටතේ අවසර පත්‍ර සහ බලපත්‍ර නිකුත් කරනු ලැබ ඇත්නම් මිස සහ නිකුත් කරනු ලබන තෙක්, මේ පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර සහ බලපත්‍ර ලෙස දිගටම බලාත්මකව සහ ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

1968 අංක14 දරන සංචාරක සංවර්ධන පනත සංශෝධනය කිරීම.

**68**. 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ පනතේ 1 වන වගන්තියට ඉක්බිතිව ම, ඒ පනතේ 1අ වගන්තිය ලෙස ක්‍රියාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"ප්‍රධාන පනත" සහ "මණ්ඩලය" යන පාඨවලට පිළිවෙලින් "2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත" සහ", ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය" යන යෙදුම් ආදේශ කිරීම.

1අ. මේ පනතේ "ප්‍රධාන පනත" සහ "මණ්ඩලය" යන යෙදුම් යෙදී ඇති කවර හෝ තැනක දී ඒ සඳහන් කිරීම් පිළිවෙලින් "2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත" ට සහ "2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 2 වන වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය" ට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.";

(2) ඒ පනතේ IV වන කොටසේ I වන පරිච්ඡේදයේ 77, 78, 79, 80, 81 හා 82 දරන වගන්ති ඉවත් කිරීමෙන් ;

(3) ඒ පනතේ 103 වන වගන්තියේ—

(අ) "මණ්ඩලය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ;

(ආ) "නිසි බලධාරියා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ; සහ

(ඇ) "ප්‍රධාන පනත" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ;

(4) ඒ පනතේ හතර වන, පස් වන, හය වන හා හත් වන උපලේඛන ඉවත් කිරීමෙන්.

නියෝග.

**69**. (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළ කිරීමේ දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චිත ලෙස දක්වා ඇති පසු දිනයක දී ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු, හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියට පමුණුවනු ලැබිය යුතු ය. එලෙස අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුතු නමුත්, ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එලෙස පරිච්ඡින්න කරන ලදැයි සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

**70**. අධිකාරියේ යම් කාර්යයන් සඳහා යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අවශ්‍ය කරන අවස්ථාවක, ඒ ඉඩම හෝ ඒ සම්බන්ධතාවය අධිකාරිය සඳහා ආණ්ඩුව විසින් (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගත හැකි අතර ඒ පනතේ

විධිවිධාන, ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව අත්කර ගැනීමේ කාර්යය සඳහා අදාළ විය යුතු ය. ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව පොදු කාර්ය සඳහා අවශ්‍ය වී ඇති ඉඩමක් හෝ සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**71**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.